# බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කළා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යාංශය

# පුරප්පාඩු තනතුරු

බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියෙහි පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## මෘදුකාංග සංවර්ධක ( SOFTWARE DEVELOPER ) (පුරප්පාඩු 01)

### සුදුසුකම් සහ පළපුරුද්ද

**(අ)** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණික විද්‍යාව විෂයයක් සහිතව උපාධියක් ලබා තිබීම සහ පරිගණක ක්ෂේත්‍රයේ අවුරුදු 03 ක වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම.

**හෝ**

**(ආ)** පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ පරිගණක ක්ෂේත්‍රයේ අවුරුදු 02 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

**(ඇ)** අවම වශයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 7 වෙනි මට්ටම හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන වෙනත් සුදුසුකමක් සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අවුරුදු 03 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

### තනතුරට අදාල කාර්යයන්

- ආයතනික මෘදුකාංග අවශ්‍යතාවයන් විශ්ලේෂණය කිරීම
- නව මෘදුකාංග වැඩසටහන් පර්යේෂණ, නිර්මාණය සහ ලිවීම
- නව මෘදුකාංග වැඩසටහන් අත්හදා බැලීම සහ දෝෂ හඳුනාගැනීම
- පවතින වැඩසටහන් වල නවීකරණය කළයුතු කොටස් හඳුනා ගැනීම, විශ්ලේෂණය, සංවර්ධනය කිරීම
- කාර්මික පිරිවිතර නිර්මාණය
- මෘදුකාංග දෝෂ නිවැරදි කිරීම, පද්ධති නඩත්තුව හා මෙහෙයවීම
- නව තාක්ෂණය අධ්‍යනය කිරීම හා හඳුන්වා දීම

### වැටුප් පරිමාණය

MA 4 - 2016 - රු. 37,970/- - 10 x 755/- - 15 x 930/- - 5 x 1,135/- - 65,145/-

මූලික වැටුප් තලය - 2020.01.01 රු. 37,970/- + ජී. වී. දීමනාව

**බඳවා ගැනිමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ.

**පත් වීමේ ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

**සෑම ඉල්ලුම්කරුවෙකුම : -**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.
3. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
4. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය. ඉල්ලුම්පත් කැඳවන අවසන් දිනය වන විට බස්නාහිර පළාත තුල වසර 03 ක් අඛණ්ඩ පදිංචිය තහවුරු කල යුතුය.
5. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් එවිය යුතු ආකාරය : -**

i) 2021.03.19 දිනට හෝ ඉන් පෙර ලැබෙන සේ සියලු අයදුම්පත් අදාල සහතිකපත් වල පිටපත් සමඟ ලියාපදංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම්පස අයදුම් කරන තනතුර සඳහන් කල යුතුය. අදාල අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් සහතික පත්‍ර වල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. තවද අපේක්ෂකයා තෝරාගනු ලැබුවහොත් මසක කාලයක් ඇතුළත ඔහු සේවයෙන් මුදා හැරිය හැකි බව එම ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

ii) ඉහත (අ),(ඇ) යටතේ ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් ජාතික විශ්ව විද්‍යාලයකින් හැර වෙනත් ආයතනයකින් (දේශීය/විදේශීය) එකී සුදුසුකම් සපුරා ඇති විටකදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයක් බව එම කොමිෂන් සභාව විසින් සහතික කල ලිපියක් ඉදිරිපත් කලයුතුය.

iii) ඉහත (ඇ) සුදුසුකම් යටතේ ඉල්ලුම්කර ඇති අයදුම්කරුවන් NVQ 07 මට්ටමෙන් උපයා ඇති වෙනත් සුදුසුකම් NVQ 07 මට්ටමට සමාන බවට තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් සහතික කල ලිපියක් ඉදිරිපත් කල යුතුය.

ඉහත i) ii) හා iii) හි සඳහන් ලේඛණ අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමේ සහ සුදුස්සන් තෝරාගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීමේ අයිතිය තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය සතුවේ.

**සභාපති,**
**තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය,**
**ශ්‍රී සංඝරාජ මාවත,**
**කොළඹ 10.**

www.mytutor.lk

Source: Sent from suriyage.p@itrda.wp.gov.lk (2020.03.04)